# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
மகளிர் சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
Ministry of Women, Child Affairs and Social Empowerment


මගේ අංකය DSD/HO/05/MF/02/01/AD9    ඔබේ අංකය / உமது இல / Your No ..............................    දිනය / திகதி / Date 2023.10.02

දිස්ත්‍රික් ලේකම්/ අතිරේක සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල්,
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,
නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ,
සමෘද්ධි බැංකු හා බැංකු සමිති කළමනාකරුවන්,

**<u>ගිණුම්කරණ සහ ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව හදාරන ලද නිලධාරීන් සඳහා සහතික පත් ප්‍රදානය.</u>**

ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය (CMA ) හා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්ෂුද්‍ර මූල්‍ය/ මහා සංගම් අංශය ඒකාබද්ධව සමෘද්ධි ප්‍රජාමූල බැංකු සහ බැංකු සමිති වල සේවය කරන නිලධාරීන් සඳහා පවත්වන ලද උක්ත පාඨමාලාව හදාරන ලද නිලධාරීන්ට සහතික පත්‍ර ප්‍රධානෝත්සවය 2023.10.16 දින පෙ.ව.08.30 සිට ප.ව 2.00 දක්වා කොළඹ, ශාන්ත බිෂොප් විද්‍යාලිය ශ්‍රවණාගාරයේදී පැවැත්වේ.

එම සහතික පත්‍ර ප්‍රධානෝත්සවය සඳහා මෙම ලිපිය සමඟ අමුණා ඇති ලේඛනයේ නම් සඳහන් නිලධාරීන් පමණක් සහභාගි කරවන ලෙස කාරුණිකව දන්වන අතර පැමිණෙන පිරිමි නිලධාරීන් කලිසම, කමිසය සහ ටයි පටියක් ද ගැහැනු නිලධාරිනියන් සාරියකින් ද සැරසී උත්සවයට පැමිණිය යුතුය.

මේ සඳහා සහභාගි වන නිලධාරීන් ට රාජකාරි නිවාඩු අනුමත කරනු ලැබේ. සහභාගි වන්නන් සඳහා ගමන් වියදම් හා සංයුක්ත දීමනාව අදාළ සමෘද්ධි බැංකුව/ බැංකු සමිතිය මගින් දැරීමට අනුමැතිය ලබා දෙමි. සහතික පත්‍ර ප්‍රදානෝත්සවයට නිලධාරීන් සහභාගි වීම නිසා කිසියම් බැංකුවක දෛනික බැංකු කටයුතු කිරීමට යම් අපහසුතාවක් ඇත්නම් ඒ බව පෙර දැනුම්දීමක් කොට ප්‍රතිලාභීන් දැනුවත් කර එදිනට බැංකුව වසා තැබීම සඳහා දිස්ත්‍රික් අධ්‍යක්ෂ මගින් ප්‍රධාන කාර්යාලයේ ක්ෂුද්‍ර මූල්‍ය අධ්‍යක්ෂගේ අනුමැතිය ලබාගත යුතුය.

මෙම පාඨමාලාව හදාරා දැනට සමෘද්ධි බැංකු හෝ බැංකු සමිති නොවන ස්ථානයක රාජකාරි කරන නිලධාරීන් සඳහා පාඨමාලාව හදාරන අවස්ථාවේ සේවය කළ සමෘද්ධි බැංකුව හෝ බැංකු සමිතිය මගින් ගමන් වියදම් හා සංයුක්ත දීමනාව ගෙවිය යුතුය.

මෙම සහතික පත්‍ර ප්‍රධානෝත්සවයට නිලධාරීන් සහභාගි කිරීම සම්බන්ධයෙන් CMA ආයතනය මගින් කරනු ලබන දැනුම් දීම් සහ උපදෙස් සම්බන්ධයෙන් අවශ්‍ය සහාය ලබා දෙන ලෙසත්, සහතික පත්‍ර ලාභීන් දැනුවත් කරන ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.

ආර්. පී. [illegible] තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්.

| | | |
|---|---|---|
| 01. | ලේකම්, කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය | : කා.දැ.ගැ.ස. |
| 02. | උපදේශක -ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය | : අ.ක.ස |
| 03. | නියෝජ්‍ය අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන) | :අ.ක.ස |


1 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | | | | |
|---|---|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) | ප්‍රධාන ගණකාධිකාරී | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) | කාර්යාලය |
| பணிப்பாளர் தலைமையதிபதி | மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) | பிரதான கணக்காளர் | பணிப்பாளர் (குறு நிதி ) | அலுவலகம் |
| Director General | Additional Director General (Admin & Establishment) | Chief Accountant | Director ( Micro Finance) | Office |
| 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| samurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |


CamScanner